**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-----------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්කණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. එකතුව රු.44,128,797 ක් වූ වත්කම් අයිතම 04 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| ii. සමාලෝචිත වර්ෂයේ ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්ත 02 කට අදාලව ගෙවිය යුතු රු.1,672,165 ක් සඳහා රු.2,000,000 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| iii. සමාලෝචිත වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ඉටුකළ රිදී ඇල මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයට අදාලව ගෙවිය යුතු රු.1,471,864 ක් සඳහා රු.1,702,691 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | 2018 වර්ෂයේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකළ රිදීඇළ මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වන ණයහිමි ප්‍රතිපාදන වැඩියෙන් දක්වා ඇති අතර, නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

| | | |
|---|---|---|
| iv. සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු කඩකාමර කුලී රු.1,341,955 ක් රු.1,274,470 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | ලැබිය යුතු කඩ කාමර කුලී ගිණුම්ගත කිරීමේදී සිදුවී ඇති දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| v. සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.96,212 ක් සඳහා ගිණුම් වල ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගෙවිය යුතු රු.96,212 ක් අඩුවක් දක්වා ඇති අතර, එම දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| vi. පරිග්‍රහණ ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් හා පරිත්‍යාග පොත් වටිනාකම රු.84,555 ක් රු.61,080 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | 2018 වර්ෂය තුළ මිලදී ගත් හා පරිත්‍යාග පොත් වටිනාකම 2018 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගෙන නැති අතර, එම දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| vii. සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල යුතු වේ. | 2018 වර්ෂය තුළ ලැබිය යුතු උසාවි දඩ වටිනාකම 2018 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගෙන නැති අතර, එම දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සඳුන්පුර ග්‍රාමෝදය මණ්ඩලය සහ නාමල්ඔය ප්‍රාදේශීය සභාව වෙත පිළිවෙලින් රු.25,000 ක් සහ රු.15,000 ක් ලෙස 1998 වර්ෂයේදී ලබාදෙන ලද අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු සිදුකර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු යුතු වේ. | 1998 වර්ෂයේ සිට ඇති නොපියවන ලද අත්තිකාරම් මුදල් ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.24,228,156 ක වත්කම් විෂයයන් 04 ක් හා රු.6,183,288 ක වගකීම් විෂයන් 02 කට අදාල ලේඛන, උප ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථන සහතික ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | ඉදිරි වර්ෂයේදී අදාල ලේඛන, උප ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථන සහතික සකස් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | (රු.) | | | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (4) වගන්තිය | 57,350 | ව්‍යාපාර බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පනතතෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු යුතු වේ. | විවිධ අවස්ථාවලදී මෙම අය දැනුවත් කරන ලදි. සමහර ව්‍යාපාර වසා දමා තිබීම හේතුවෙන් ඉහත අගය අය කර ගැනීමට අදාළ පාර්ශවයක් හඳුනා ගැනීමට නොහැකි වී ඇත. ආදායම් පරීක්ෂකගෙන් මේ සම්බන්ධව විධිමත් වාර්තාවක් ගෙන්වා ගෙන ප්‍රාදේශීය සභා විධායක රැස්වීමේදී තීරණයක් ගෙන ඉදිරි කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු වාහන 12 ක ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | අදාල වාහනවල ඉන්ධන පරික්ෂාව කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 1,698,000 | සභාව සතුව ඇති පරිගණක 17 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු යුතු වේ. | සභාව සතු රු.1,698,000ක් වටිනා පරිගණක බඩු වට්ටෝරු පොතේ සඳහන් කර ඇති අතර, මේ සඳහා වෙනම ලේඛනයක් කඩිනමින් නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,071,890 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,587,392 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| වරිපනම් හා බදු | 1,488,956 | 1,728,772 | 1,466,069 | 2,555,273 | 1,543,956 | 1,596,266 | 1,115,942 | 2,264,129 |
| කුලී | 10,343,566 | 9,616,676 | 8,970,726 | 1,087,200 | 8,117,866 | 8,829,540 | 8,350,860 | 521,085 |
| බලපත්‍ර ගාස්තු | 1,510,600 | 1,875,050 | 1,833,700 | 57,350 | 1,441,000 | 1,804,110 | 1,815,310 | 20,500 |
| වෙනත් ආදායම් | 1,864,000 | 269,335 | 3,604,485 | 187,270 | 1,833,000 | 2,306,395 | 2,198,187 | 188,500 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

**(අ) උසාවි දඩ**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හඳුනාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල හිඟ උසාවි දඩ හඳුනාගෙන අයකරගත යුතු වේ. | උසාවි දඩ මුදල් දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් උසාවියෙන් ගෙවීමට ඇති මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව ද, වාර්තා කරමි. |

**(ආ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.53,000 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකරගත යුතු වේ. | අදාළ බදු මුදල් ඉල්ලීම් සිදුකර තිබුණ ද, මෙම මුද්දර ගාස්තු අප කාර්යාලය වෙත මෙතෙක් ලබා නොදෙන ලදී. ඒ අනුව නැවත මෙම මුද්දර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 01 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්ති 15 ප්‍රකාරව පැනවිය යුතු අතුරු ව්‍යවස්ථා සභාව මගින් සකස් කර නැගෙනහිර පළාත් සභාවට ඉදිරිපත් කර තිබූ නමුත් එම අතුරු ව්‍යවස්ථා සම්මත කිරීමක් සිදු වී නොමැත. ඒ අනුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පමණක් සම්මත කර ඇති අතර, එය අප ආයතන ක්‍රියාවට නංවනු ලැබේ. එසේම මේ වන විට නැගෙනහිර පළාත් සභාව විසින් අතුරු ව්‍යවස්ථා 05 ක් ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කලයුතු වේ. | මෙම වසරට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණ ද, ඉදිරි වර්ෂය සඳහා සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලිහිණියාගම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ප්ලාස්ටික් කුඩු කරන යන්ත්‍රයක් මිලදී ගැනීමට රු.1,000,000 ක ප්‍රතිපාදන අනුමත වී 2018 වර්ෂයේදී | ප්ලාස්ටික් කුඩු කරන යන්ත්‍රය සපයා සවි කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක යුතු වේ. | ප්ලාස්ටික් කුඩු කරන යන්ත්‍ර මිලදී ගැනීමට මිල කැඳවීම් කර අදාළ සැපයුමකරු විසින් රු.600,000 ක් වටිනා එම යන්ත්‍රය අප ආයතනය වෙත ලබා දුන්න ද, එහි කාර්මික දෝෂ කිහිපයක් හේතුවෙන් ප්‍රතික්ෂේප කිරීමට සිදුවුණි. නමුත් මෙම සැපයුම්කරුට එම යන්ත්‍රය සඳහා කිසිදු ගෙවීමක් සිදු නොකරන ලද අතර, ඉහත මුදල් |

| | | |
|---|---|---|
| රු.390,462 ක් වැයකර තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. | | ප්‍රාදේශීය සභා කර්මාන්ත ශිණුමේ ඇති බව වාර්තා කරන අතර, එහි විද්‍යුත් පරිපථ හා විදුලි සම්බන්ධතාව සඳහා ඉතිරි මුදල් වැය කර ඇත. මෙම යන්ත්‍රය නැවත නිවැරදි ලෙස භාර දෙනු ලැබූ පසුව එම මුදල් ගෙවන බවත්, සැපයුම්කරු ඒ සඳහා එකග බවත් මෙයින් වාර්තා කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත යුතු වේ. | මේ පිළිබඳ දැනුවත්වීම් කටයුතු කිරීමට ඉදිරියේදී සිදුකරනු බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු ධාවන තත්ත්වයේ පවතින වාහන 13 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු යුතු වේ. | මේ වන විට අදාළ සියලු වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කරමින් සිටින අතර, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට ඇති වාහන (UNOP) සඳහා අදාළ පැවරුම් සිදු කිරීමෙන් පසුව ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හැකි වේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක් සඳහා නිලධාරීන් 11 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතු වේ. | මෙම බඳවා ගැනීම් නැගෙනහිර පළාත් සභාව විෂයට යටත් වේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 10 ක් ස්ථාපිත කර තිබුණද, ඒ සඳහා සමාලෝචිත වර්ෂයට අයකර ගත යුතු රු.30,000 ක ව්‍යාපාර බදු අයකර ගෙන නොතිබුණි. | ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු යුතු වේ. | එම ආයතන වලින් මේ වන විට අදාළ ව්‍යපාර බදු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| ii. ප්‍රාදේශීය සභාව විසින් අවසන් වරට වරිපනම් තක්සේරුව සිදුකළ 2011 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ද වරිපනම් අයකිරීම සිදුකර තිබුණි. | නව තක්සේරුවක් සිදුකර වරිපනම් බදු අයකරගත යුතුය. | නැගෙනහිර පළාත තුළ තක්සේරු දෙපාර්තමේන්තු කාර්යාල මඩකලපුව නගරයේ පිහිටා ඇති අතර, එවැනි කාර්යාල 01ක් පමණක් පැවතීම අප වාර්ෂිකව තක්සේරු කිරීම් සඳහා සිදුකරන ඉල්ලීම් ප්‍රමාද වීමට හේතු වී ඇත. මේ පිළිබඳව වරින් වර විමසීම් සිදු කළද, මෙම ප්‍රමාදය සිදුවෙමින් පවතී. 2020 වර්ෂයේ සිට මෙම වරිපනම් තක්සේරු කිරීමට නැවත ඉල්ලීමක් යොමුකර ඇත. |
| iii. 2008 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත සභාව සතු කඩකාමර 05 කින් සමාලෝචිත වර්ෂයේදී ද කඩකාමර කුලී අයකරගෙන තිබුණි. | නව තක්සේරුවක් සිදුකර කඩකාමර කුලී අයකරගත යුතු වේ. | 2008 වර්ෂයේ තක්සේරු වටිනාකමට කඩ 05ක් බදු දී ඇති අතර, එම කඩ දීර්ඝ කාලීන බදු යටතේ ලබා දී කඩිනමින් මෙම තක්සේරු කිරීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව වාර්තා කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 වර්ෂයේදී ඉදිකරන ලද රු.1,990,190 ක් වටිනා ගොඩනැගිලි 02 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | අදාල වත්කම් ලේඛන ගත යුතු වේ. | 2016 වර්ෂයේදී ඉදිකරන ලද එම වත්කම් ලේඛන ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද බව වාර්තා කරමි. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **i.** මහවැලි අධිකාරිය, රාජ්‍ය නොවන සංවිධාන හා මුදල් අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය සභාවට ලබා දුන් වාහන 06 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන වල නිත්‍යානුකූල අයිතිය සභාවේ නමට පවරා ගත යුතු වේ. | මෙම වාහන මේ වන විට ගර්හිත තත්වයේ අළුත්වැඩියා කිරීමට නොහැකිව පවතින අතර, එම වාහන වල අයිතිය අනුව ලබාදුන් ආයතනයටම පවරා ගන්නා ලෙස දන්වා යවා ඇත. ඒ අනුව අදාළ පැවරුම් කටයුතු අප ආයතනය වෙතම එම ආයතන සිදුකළහොත් එම වාහන වල ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු සංවිධානය කරමින් සිටී.<br>එසේම මෙම ලේඛනයේ සඳහන් අනිකුත් වාහන UNOP ආයතනයේ පරිත්‍යාග ලෙස ලබා දී ඇති අතර, එහි ප්‍රධාන කාර්යාලය ද, නොමැති වීම හේතුවෙන් මෙම වාහන වල පැවරුම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති අතර, මේ සඳහා නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් වෙත අදාළ උපදෙස් සඳහා යොමුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| **ii.** | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු හෙක්ටයාර් 1.72 ක් වූ ඉඩම් කැබලි 04 ක් හා භූමි ප්‍රමාණය ගණනය නොකළ ක්‍රීඩා පිටි 07 ක අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | දේපල වල නිත්‍යානුකූල අයිතිය සභාවේ නමට පවරා ගත යුතු වේ. | ඔබ විසින් දක්වා ඇති හෙක්ටයාර් 1.47 ක භූමි ප්‍රමාණ මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් විධිමත් ලෙස අප ආයතනයට ප්‍රධාන පත්‍රයකින් භාර දී ඇත.<br>ක්‍රීඩාපිටි 07 ක භූමි ප්‍රමාණ සඳහා මැනුම් නියෝග මහවැලි අධිකාරිය වෙත දන්වා යවා ඇති අතර, එම නියෝග ලැබූ විගස මැනුම් කටයුතු සිදුකර අවශ්‍ය කටයුතු සිදුකර අවසන් කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

--------------

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

| විගණන නිරීක්ෂණ<br>------------------ | නිර්දේශය<br>---------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>------------------------- |
|---|---|---|
| 2006 මාර්තු 24 නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කලයුතු වේ. | ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරි වර්ෂයන් සඳහා සකස් කිරීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. |